# සාමාන්‍ය සමයේ දසසතරවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 49: 29–33, 50: 15–25

"දෙවියන් වහන්සේ ඔබ වෙත කරුණාවෙන් බලා මේ දේශයෙන් බොහෝ දෙනෙකුන්ගේ ගැළවීම සළසන සේක."

ඉන්පසු ජාකොබ් ඔවුන්ට අණ කරමින් කතා කොට, "මම මාගේ සෙනගට එකතු වන්නට යමි. හිත්තිය ජාතික ඒප්‍රොන්ගේ ඉඩමෙහි ඇති ගුහාවෙහි එනම්, කානාන් දේශයේ මම්රේ ඉදිරිපිට මක්පේලාගේ ඉඩමෙහි තිබෙන ආබ්‍රහම් සොහොන් බිමක් වශයෙන් ඉඩමක් සමග ඒප්‍රොන්ගෙන් මිලට ගත් ඔහුට අයිති ගුහාවෙහි, මාගේ පියවරුන් ළග මා භූමදාන කරන්න. ආබ්‍රහම් සහ ඔහුගේ බිරිඳ වන සාරා භූමදාන කරන ලද්දේ එහිය. ඊසාක් සහ ඔහුගේ බිරිඳ වන රෙබෙකා භූමදාන කරන ලද්දේත් එහි ය. මා ලෙයා භූමදාන කළේත් එහිය. ඉඩම සහ එහි ඇති ගුහාව හේත්ගේ සෙනගගෙන් මිලයට ගන්නා ලදි"යි කීවේය. මෙසේ ජාකොබ් තම පුතුන්ට උපදෙස් දී නිම කළ කල්හි ඔහු තම පාද යහනට ගෙන අවසන් හුස්ම හෙළා තම සෙනගට එක් විය.

ජෝසෙප්ගේ සහෝදරයෝ තම පියා මළ බව දුටු විට තමන් අතරේ කතා කරමින් "ඇතැම්විට ජෝසෙප් අපට වෛර කරන්නට පුළුවන. ඇත්තටම අප ඔහුට කළ සියලු නපුරු දේ ගැන ඔහු අපෙන් පළිගත හැකි ය"යි කීහ. එබැවින් ඔව්හු ජෝසෙප් වෙත පනිවුඩයක් යවමින් "ඔබේ පියා මැරෙන්නට කලින් අපට කතා කොට, දැන් ඉතින් ඔබේ සහෝදරයන් ඔබට කළ සියලු නපුරුකම් වලටත්, ඔවුන්ගේ ඒ අපරාධයට හා පාපයටත් කරුණාකර ඔවුන් කමා කරන්නැයි

ජෝසෙප්ට දැන්වීමට අපට අණ කළේය. "එබැවින් දැන් කරුණාකර ඔබේ පියාගේ දෙවියන්ගේ දාසයන් වන අප කළ අපරාධයට සමාව දෙන්නැ"යි කීහ.

එහෙත් එලෙස ඔහුට කී විට ජෝසෙප් හඬන්නට විය. ඔහුගේ සහෝදරයෝ ගොස් ඔහු ඉදිරියෙහි වැඳ වැටී, "මෙන්න, අපි ඔබගේ දාසයෝ වෙමු"යි කීහ. එහෙත් ජෝසෙප් ඔවුන්ට කතා කොට, "බිය නොවන්න. දෙවියන් වහන්සේට හිමි තැන මට ගත හැකි ද? ඔබ නම් මට විරුද්ධව නපුරුකම් සිතුවහු ය. එහෙත් අද සිදුවී තිබෙන පරිදි, දෙවියන් වහන්සේ බොහෝ මිනිසුන්ගේ ජීවිත ගලවනු පිණිස ඒවා යහපතට හැරෙවූ සේක. එබැවින් දැන් ඉතින් බිය නොවන්න. මම ඔබ ද ඔබේ කුඩා දරුවන් ද නඩත්තු කරන්නෙමි"යි ඔවුන් සනසමින් ඔවුන් අමතා කාරුණික ලෙස කතා කළේය.

මෙලෙස ජෝසෙප් ද ඔහුගේ පියාගේ පවුල ද මිසරයේ පදිංචි වූහ. ජෝසෙප් අවුරුදු එකසිය දහයක් ජීවත් විය. තවද, ඔහු එප්‍රායිම්ගේ දරුවන් තුන්වන පරම්පරාව දක්වා දිටීය. මනස්සේගේ පුත් මාකීර්ගේ දරුවෝ ද ජෝසෙප් විසින් සිය පවුලට භාර ගන්නා ලදහ. ඔහු තම සොහොයුරන් අමතා "මාගේ අවසානය ළඟය. දෙවියන් වහන්සේ ද සැබැවින්ම ඔබ ආරක්ෂා කොට උන් වහන්සේ ආබ්‍රහම්ට, ඊසාක්ට හා ජාකොබ්ට දිවුරා පොරොන්දු වූ රටට, මේ රටින් ඔබ ගෙන යන සේකැ"යි කීය. ඉන්පසු ඔහු ඔවුන් අමතමින්, "දෙවියන් වහන්සේ සැබැවින් ම ඔබ ආරක්ෂා කරනවිට ඔබ ද මාගේ ඇට කටු මෙතැනින් ගෙන යා යුතු ය"යි කියා ඉශ්රායෙල්ගේ දරුවන්ගෙන් දිවුරුම් ගත්තේය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 105 : 1-4, 6-7

පිළිතුර: දෙවිඳුන් සොයා යන්නෝ දිරිමත් වන්නෝය.

ගීය:

සමිඳුන්ට තුති පුදන්න. එතුමන්ගේ නාමයෙන් අයදින්න.
ජාතීන් අතරේ එතුමන්ගේ ක්‍රියා පළ කරන්න. එතුමන්ට ගී ගයන්න.
එතුමන්ට පසස් ගී ගයන්න. එතුමන්ගේ පුදුම ක්‍රියා මෙනෙහි කරන්න.

එතුමන්ගේ ශුද්ධ නාමය ගැන උදන් අනන්න. සමිඳාණන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත වේවා! සමිඳාණන් ද එතුමන්ගේ බලය ද සොයා බලන්න.
එතුමාණන් හමුව නිතරම සොයන්න.

එතුමන්ගේ මෙහෙකරුන් වූ ඉශ්රායෙල් වංශයෙනි. එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවෙනි, එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ ආශ්චර්යයන් ද එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි කරන්න.
එතුමාණෝ අපේ දෙවි සමිඳාණෝ ය. එතුමන්ගේ විනිසය මුළු පොළොවෙහි ය.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
යමෙක් උන්වහන්සේගේ දහම පිළිපදින්නේ ද
ඒකාන්තයෙන්ම ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත්තේය.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේගේ නාමය නිසා නින්දා කරනු ලබන්නහු නම් ඔබ ආශිර්වාද ලද්දහු ය.
මන්ද, දෙවියන් වහන්සේගේ තේජාන්විත ආත්මයාණෝ ඔබ කෙරෙහි රඳන සේක.

ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 10: 24–33

"ශරීරය නැසුවත් ආත්මය නසන්නට නුපුළුවන් අයට බිය නොවන්න."

ස්වාමින් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක. "ගෝලයෙක් සිය ගුරුවරයාට වඩා උසස් නොවේ. දාසයෙක් සිය ස්වාමියාට වඩා උසස් නොවේ. ගෝලයා සිය ගුරුවරයාට සමාන වීමෙන් ද සේවකයා තම ස්වාමියාට සමාන වීමෙන් ද සෑහීමට පත් විය යුතුය. ඔව්හු ගෘහ මූලිකයාට 'බෙල්සෙබුල්' යයි කීවොත්, ගෙයි වැසියන්ට ඊටත් වැඩියෙන් අපහාස නොකරත් ද?

"එබැවින් මිනිසුන්ට බිය නොවන්න. මන්ද, දැන් සැඟවී ඇති සෑම දේම හෙළි කරනු ලැබේ. සෑම රහසක්ම ප්‍රකට කරනු ලැබේ. මා විසින් ඔබට අඳුරේ දී පවසන ලද දෙය ඔබ දවාලේ දී කියන්න. ඔබේ කනට රහසින් ඇසෙන දෙය, ගෙමුදුන් වලින් ප්‍රකාශ කරන්න. ශරීරය නැසුවත් ආත්මය නසන්න නුපුළුවන් අයට බිය නොවන්න. එහෙත් ආත්මය ද ශරීරය ද නිරයෙහි විනාශ කරන්නට පුළුවන් තැනැන්වහන්සේට ම බිය වන්න. ගේ කුරුල්ලන් දෙදෙනෙකු තුට්ටුවකට විකුණනවා නොවේද? එහෙත් එයින් එකෙක්වත් ඔබේ පියාණන් වහන්සේ නොදැනුවත්ව බිමට නොවැටෙන්නේය. ඔබේ හිසකේ සියල්ල පවා ගණන් කොට ඇත. එබැවින් බිය නොවන්න. ගේ කුරුල්ලන් රාශියකට වඩා ඔබ අගනේ ය."

යමෙක් මනුෂ්‍යයන් අබිමුවෙහි ඔහු පිළිගත් බවට සාක්ෂි දරන්නේ ද, මමත් ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේ අබිමුවෙහි ඔහු පිළිගත් බවට සාක්ෂි දරන්නෙමි. එහෙත් යමෙක් මනුෂ්‍යයන් අබිමුවෙහි මා ප්‍රතික්ෂේප කරන්නේ ද, මමත් ස්වර්ගයේ වැඩ සිටින මාගේ පියාණන් වහන්සේ අබිමුවෙහි ඔහු ප්‍රතික්ෂේප කරන්නෙමි."

සුවිශේෂ වාක්‍යය එසේය.